# ලෝක පරිසර දිනය

ලෝක පරිසර දිනය ජූනි මස 5 දිනට යෙදිති. මේ අප අවට පවතින වටාපිටාව පිළිබඳව යම් අවබෝධයක් ඇති කර ගැනීම සඳහා ජනතාව යොමු කරවීම එමගින් බලාපොරොත්තු වෙයි.

පරිසරය පිළිබඳව විවිධ අර්ථකථන ඇතිමුත් ඉතා සරල ලෙස එය 'අප අවට ඇති වටාපිටාව' ලෙස හැඳින්විය හැකි ය. අප අවට ඇති ගහ කොළ, සතුන්, වාතය හා ජලය ආදි සියල්ල පරිසරයේ අගයන් වේ.

ඈත අතීතයේ පිවත් වූ මිනිසුන් හා පරිසරය අතර පැවතියේ ඉතාසමීප සම්බන්ධතාවකි. ජීවත්වීම පරිසරයේ ම කොටසක් ලෙස පැවතුණු ඒ යුගයේ ද පරිසර විනාශය පිළිබඳව සොයා බැලීමේ අවශ්‍යතාවක් නොතිබිණ.

එහෙත් කලින් කලට විවිධ ශිෂ්ටාචාර ගොඩ නැගූ මිනිසුන් ඒ නිසාම ඇති කළ පරිසර ගැටලූ තුළින් පරිසර විනාශයට මඟ පෑදිනි.

පරිසර විනාශය මඟින් මිනිසාගේ පැවැත්මට විශාල තර්ජනයක් පවතින බැවින් පරිසරය සුරැකීමේ අවශ්‍යතා පිළිබඳව මිනිසාගේ අවධානය යොමු කරවීම දැනුම ලබා දීම හා ප්‍රායෝගිකව එය ඉටු කර ගැනීම මෙවන් පරිසර දිනයක දී සිදු විය යුතු වැදගත් ම සේවාව ලෙස හැඳින්විය හැකි ය.

නූතන පරිසරය අපට ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙද දැක්විය හැකි ය. ඒවා නම්,

1. ස්වභාවික පරිසරය
2. මිනිසා විසින් ගොඩ නගන ලද පරිසරය
3. මතවාදී පරිසරය

ඒවා මේ ආකාරයෙන් විස්තර කළ හැකි ය.

1. ස්වභාවික පරිසරය

මිනිස් සීමාවට හමු නොවූ ස්වාභාවික වටාපිටාව මෙනමින් හැඳින් වේ. නූතන සමාජයේ ප්‍රයෝජනයට නොගැනුණු එසේ ම යම් තරමක හෝ ආරක්ෂා වී පවතින අභය භූමි වැනි ප්‍රදේශ මේ ගණයට ඇතුළත් වෙයි.

2. මිනිසා ගොඩ නැගූ පරිසරය

මිනිස් අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා මිනිසා විසින් නිර්මාණය කර ගත් පරිසරය යි. මහා පරිමාණයෙන් මෙන් ම ඉතා සුළුවෙන් කෙරෙන වෙනස්කම් ගැන වුවද මෙම හැඳින්වීම එක සේ සැලකෙයි. ඒ අනුව නිවහන, ගම, නගර, ජනාවාස ඇතුළු සෑම ඉදි කිරීමක් ම මෙයට අයත් වෙයි.

3. මතවාදී පරිසරය

බොහෝ දුරට මිනිසුන් තම ආර්ථිකය සකස් කර ගත් අන්දම හා ඊට ප්‍රයෝජනයට ගන්නා පාරිසරික සම්පත්වල ස්වභාවය මත ඔවුනගේ සංස්කෘතිය , වටාපිටාව තීරණය වෙයි.

ඒ අනුව ඔවුන්ගේ ගති පැවතුම්, හැදියාව, ආවාහ-විවාහ, චාරිත්‍ර ආදී සියල්ල තීරණය වන්නේ ඊට අනුකූල වන ලෙසිනි. මතවාදී පරිසරය ලෙස හැඳින්වෙන්නේ එය යි.

ඉහත සඳහන් කළ අංග තුන පිළිබඳව මූලික අවබෝධයක් ලබා දීමෙන් පරිසරය පිළිබඳ මනා වැටහීමක් ඇති කර ගත හැකි ය. පරිසර සංවිධාන වෙත පැවරී ඇති වගකීම ද එය යි. පරිසර හානිය පිළිබඳව ඊට සම්බන්ධ පුද්ගලයන් දැනුවත් කිරීම තුළින් පරිසර සංවිධාන-පරිසර සුරැකීමට ලබාදෙන දායකත්වය අගය කළ යුත්තේ ද එබැවිනි.

පරිසරය සුරැකීම මහ පොළවට පමණක් සීමා නොවේ. මහා සාගරය මෙන් ම වා තලය දක්වා එය පුළුල් වෙයි. කෙසේ වුවද මනා සැලැස්මකින් තොරව පරිසරය සුරැකීම මිරිඟුවක් බව අවබෝධ කර ගැනීම ද අත්‍යවශ්‍ය ය.

පරිසරය ආශ්‍රිත තොරතුරු ගෙන එන මුද්දර රැසක් ලෝ පුරා රටවලින් නිකුත් වී තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය ද ඒ අතරින් විශාල මෙහෙයක් ඉටු කර ඇත. මේ ඔබ දකින්නේ එවන් මුද්දර සමූහයකි. ❑

**අනුර සමරවීර**